# පළාත් පාලන දෙපාර්තමේන්තුවේ පුස්තකාල සඳහා පොත් මිලදී ගැනීමේ නිර්ණායක - 2022

ලේඛකයන්ට ආධාර කිරීම සඳහා පොත් මිලයට ගැනීමේ වැඩසටහනක් දැනට මෙම දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන අතර එම වැඩසටහන යටතේ ආධාර ලබාගැනීමට කැමති ලේඛකයන් සඳහා ආකෘති පත්‍රය පුරවා ඉල්ලුම් කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ. මෙම වැඩසටහන වර්ෂය පුරාම ක්‍රියාත්මක වේ. එක් එක් ග්‍රන්ථයෙන් ගනු ලබන පිටපත් ප්‍රමාණය තීරණය කරනු ලබන්නේ ඒ සඳහා පත් කර ඇති ග්‍රන්ථ සමීක්ෂණ උපදේශක මණ්ඩලය විසිනි.

මෙම වැඩසටහන යටතේ මිලයට ගනු ලැබීම පිණිස එම පොත් පිළිබඳව පහත සඳහන් කොන්දේසි සම්පූර්ණ කර තිබීම අත්‍යවශ්‍ය වේ.

01. ආසන්න වසර දෙකක් (02) ක් තුළ ප්‍රකාශයට පත් කොට ඇති ග්‍රන්ථ විය යුතුය. (ප්‍රකාශිත වර්ෂය නිශ්චිතවම ග්‍රන්ථයේ සඳහන් කළ යුතුය.)

02. ග්‍රන්ථය අවම වශයෙන් මුද්‍රිත පිටු 49 කින් සමන්විත විය යුතුය. ළමා කෘතියක් නම් අවම මුද්‍රිත පිටු සංඛ්‍යාව 16 ක් විය යුතුය.

03. එක් කර්තෘවරයෙකුට වසරක් තුළ ආධාර ලබා දෙනුයේ ප්‍රකාශන දෙකක් සම්බන්ධයෙන් පමණි

04. අන්තර්ගතය, නිමාව කෙරෙහි සැලකිල්ලක් දක්වනු ලැබේ. තත්ත්වයෙන් බාල මුද්‍රිත කඩදාසියෙහි මුද්‍රිත සහ මුද්‍රණ දෝෂ සහිත ග්‍රන්ථ නොවිය යුතුයි. මුද්‍රණ දෝෂ රහිතව උසස් නිමාවකින් යුක්ත වීම

05. ස්ව තන්ත්‍ර නිර්මාණයක් නම් කර්තෘ විසින්ද, පරිවර්තනයක් නම් පරිවර්තකයා විසින්ද පොත් ඉදිරිපත් කළ යුතුය.

06. නියෝජිතයකු මගින් පොත් ඉදිරිපත් කරනු ලබන්නේනම්, කර්තෘ විසින් ඒ සඳහා අවසර ලබා දී ඇති ලිපියක් ඉදිරිපත් කළ යුතුය. (ප්‍රකාශන ආයතන මගින් ඉදිරිපත් කරනු ලබන ග්‍රන්ථ භාර නොගැනේ)

07. පිළිගත් ප්‍රජාවකට සෘජුවම පහර එල්ල කරන කරුණු හෝ සදාචාර සම්මුතීන්වලට එරෙහි කරුණු ඇතුළත් පොත් භාරගනු නොලැබේ.

08. විභාග සඳහා නියමිත ග්‍රන්ථ (පාඨ ග්‍රන්ථ) හා ප්‍රශ්නෝත්තර ස්වරූපයෙන් සකස් කර ඇති ග්‍රන්ථ සඳහා ආධාර ලබා දීමක් සිදු නොකරයි.

09. කතෘ ප්‍රකාශනය හා මනා නිමයුමකින් යුත් ග්‍රන්ථ සඳහා ප්‍රමුඛත්වය දෙනු ලැබේ. පොතක ප්‍රමිතිය, ගුණාත්මක භාවය, අන්තර්ගතය විශේෂයෙන් සලකා බලනු ලැබේ.

10. පොතේ මුල් පිටු ග්‍රන්ථ විද්‍යාත්මක පිටු සැකැස්මට අනුකූල විය යුතුය. ( ඇමුණුම් 01)

11. ලිපි සංග්‍රහ/වාර සඟරා/ වාර ප්‍රකාශන සඳහා මෙම වැඩපිළිවෙල යටතේ සුදුසුකම් නොලැබේ.

12. පුස්තකාල ග්‍රන්ථයක් ලෙස අනුමැතිය ලබා ISBN අංකය මුද්‍රණය කර ඇති පොත් කෙරෙහි ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

13. ග්‍රන්ථයේ වෙළඳ මිල මුද්‍රණය කර තිබිය යුතුයි.

14. මිලදී ගැනීමට අනුමත පොත් සඳහා 20% ක වට්ටමක් ලබාගනු ලැබේ.

15. පුස්තකාල කමිටුව වෙත ඉදිරිපත් කිරීම සඳහා භාර දෙනු ලබන සාම්පල් පොත දෙපාර්තමේන්තු පුස්තකාලය වෙත භාර දෙන බැවින් එය ආපසු කර්තෘ වෙත භාර දෙනු නොලැබේ. ඔබ වෙත එම පොතෙහි අවශ්‍යතාවයක් පවතින්නේනම් එය ලිඛිතව ඉදිරිපත් කර ලබා ගැනීමට හැකියාව ඇත.

16. ග්‍රන්ථයක ප්‍රථම මුද්‍රණය පමණක් ඉදිරිපත් කළ යුතුය.

17. දුර්ලභ, අත්‍යාවශ්‍ය යැයි තීරණය වන ග්‍රන්ථ ප්‍රථම මුද්‍රණයේ නොවුනද කමිටුව වෙත ඉදිරිපත් කිරීම සලකා බලනු ලැබේ.

18. පොත් මිලදී ගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අවසාන තීරණය පළාත් පාලන කොමසාරිස් සතුවේ.

**විමසීම් : පළාත් පාලන දෙපාර්තමේන්තුව,**
**ප්‍රජා සංවර්ධන අංශය,**
**204, පළාත් සභා ගොඩනැගිල්ල,**
**ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.**
**දුරකතන අංකය: 011 2093167**

**ඒ.ඩී.පී.අයි. ප්‍රසන්න**
**පළාත් පාලන කොමසාරිස්,**
**පළාත් පාලන දෙපාර්තමේන්තුව (බ.ප)**

## ඇමුණුම් 01

ග්‍රන්ථ විද්‍යාත්මක පිටු සැකැස්ම

| | | |
|---|---|---|
| 01 පිටුව | - | අර්ථ ග්‍රන්ථ නාම පිටුව |
| 02 පිටුව | - | කතෘගේ වෙනත් කෘති |
| 03 පිටුව | - | ග්‍රන්ථ නාම පිටුව |
| 04 පිටුව | - | ග්‍රන්ථ විද්‍යාත්මක විස්තරය { මුද්‍රණය, මුද්‍රණ වර්ෂය, ප්‍රකාශනයේ හිමි කම (Copy right), ප්‍රකාශනය සුවිකරණ දත්ත, ISBN අංශය) |
| 05 පිටුව | - | පිදුම |
| 06 පිටුව | - | හැඳින්වීම |
| 07 පිටුව | - | ස්තූතිය |
| 08 පිටුව | - | පටුන |

සැ.යු.

ළමා කතාවකදී ඉහත පිටු යෙදීම අනිවාර්ය නොවන අතර සුදුසු පරිදි ඒවා භාවිතා කළ හැක. ළමා කෘතියක අක්ෂර වින්‍යාසය, පද බෙදීම්, විරාම ලක්ෂණ ආදිය නිවැරදිව යෙදී තිබිය යුතුය.